## 41 – මගෙ රකවරණේ

මගේ රකවරණේ බල කොටුව මගේ
ඔබයි දෙවියනේ සඳහට ඔබයි දෙවියනේ
මගෙ පිළිසරණේ ඔබයි සමිඳුනේ
නොවේ නොවේ කිසිදු බියක් ඔබේ ළැගුම් පළේ

මහ උතුමන් රකවරණේ යටැ ගැවැසෙන්නේ
සබලවතාණන් ඇසුරේ හෙවණ ලබන්නේ
සමිඳාණන් අමතා ඔහු මෙසේ කියන්නේ
"ඔබ මැ කෙරේ පතා සිටිමින මගේ දෙවියනේ"

උගුල් අටව ඔබ නස්නට බැලුවත් සතුරා
ඔබ නිදහස් කැරැ ගන්නේ ඔබේ හිමි සඳා
එතුමෝ තම පියාපතින් ඔබ වහගන්නෝ
එතුමන් අත්තටු යටැ ඔබ සඟවා ගන්නෝ